(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක 398.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2014 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2691/'12

1.

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පේරාදෙණිය විශ්වවිද්‍යාලය තුළ පවතින මානව සහ භෞතික සම්පත්වල ඌනතාවයන් කවරේද;

(ii) මෙම ඌනතාවයන් සහ අඩුපාඩුකම් සම්පූර්ණ කිරීමට කටයුතු කරන දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉගෙනුම ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) එම විශ්වවිද්‍යාලයේ ඇති පීඨ සංඛ්‍යාව කොපමණද;

(iii) 2012 වර්ෂය සඳහා එම විශ්වවිද්‍යාලයට වෙන් කළ ප්‍රතිපාදනවල මුළු වටිනාකම කොපමණද;

(iv) එම මුදල 2011 වර්ෂය සඳහා වෙන්කළ මුදලට සාපේක්ෂව වැඩි වී හෝ අඩුවී ඇති ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3270/'12

2.

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) අද වන විට දිවයිනේ සිටින සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) 2011 සහ 2012 වසරවල දෙසැම්බර් 31 දින වන විට සිටි සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(iii) එබඳු සමාජ සහනාධාරයක් ලබාදීම පිණිස සලකා බලන නිර්ණායක කවරේද;

(iv) 2010, 2011 සහ 2012 වර්ෂවලදී මාසිකව සහ වාර්ෂිකව ඔවුන්ට ලැබුණු දීමනාව මත පදනම්ව සමෘද්ධිලාභී පවුල් සංඛ්‍යාවේ ප්‍රභේදනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) මිලදී ගැනීමේ ශක්තිය හෝ ක්‍රය ශක්තිය හෝ උද්ධමන ප්‍රවණතාවන්ට සාපේක්ෂව සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා අරමුදල් නැවත වෙන්කිරීමක් සිදුකර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3958/'13

3\.

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ අලි - මිනිස් ගැටුම නිසා වාර්ෂිකව විශාල මිනිස් ජීවිත සංඛ්‍යාවක් අහිමි වන බව දන්නේද;

(ii) 2005 වර්ෂයේ සිට මේ දක්වා එසේ අහිමිවූ මිනිස් ජීවිත සංඛ්‍යාව වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත සඳහන් කාල සීමාව තුළදී අලි - මිනිස් ගැටුම් හේතුවෙන් විනාශ වූ මිනිස් ජීවිත හා දේපළ වෙනුවෙන් ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර, මිදිගම රජයේ රෝහලේ විශ්‍රාමික වෛද්‍ය සරත් විමලසූරිය මහතා අලි - මිනිස් ගැටුමට විසඳුමක් ලෙස විදුලි වැටක් නිර්මාණය කර ඇති බවත්;

(ii) මෙම උපකරණය පරීක්ෂණ කටයුතු සඳහා යොදා ගැනීමට වනජීවී නිලධාරීන් ලබා ගෙන ඇති බවත්;

(iii) එය මේ දක්වා ආපසු ලබාදී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) වෛද්‍ය සරත් විමලසූරිය මහතා විසින් අඩු වියදමින් නිර්මාණය කරන ලද විදුලි වැට පරීක්ෂා කර බලා එය අලි - මිනිස් ගැටුමට විසඳුමක් ලෙස භාවිතයට ගැනීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4296/'13

4\.

ගරු රෝසි සේනානායක මහත්මිය,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජනතාවට පානීය ජලය සපයනු ලබන ජල මූලාශ්‍රය කවරේද;

(ii) එකී ජල මූලාශ්‍රයෙන් ජලය සපයනු ලබන ආයතනය කවරේද;

(iii) 2013 වර්ෂයේ ජූනි මාසයේ සිට ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ජනතාව මුහුණ දුන් පානීය ජල හිඟයට හේතු කවරේද;

(iv) එම පානීය ජල හිඟය මඟහැරවීම සඳහා ගත් කඩිනම් ක්‍රියාමාර්ග කවරේද;

(v) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ පවතින පානීය ජලය හිඟවීමේ ගැටලුව විසඳීම සඳහා අමතර ජල සැපයුම් මූලාශ්‍රයක් යොදා ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4443/'13

5\.
ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— විදුලි සංදේශ සහ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2014 දැයට කිරුළ සංවර්ධන වැඩසටහන යටතේ නව නිවාස ඉදිකර දීම සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ හඳුනාගෙන තිබූ නිවාස නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් වෙනුවෙන් නිවාස ඉදිකිරීම සඳහා රජය මගින් ලබා දීමට අපේක්ෂා කළ ප්‍රතිපාදන කවරේද;

(iii) එකී ප්‍රතිපාදන මත සිදුකළ නිවාස ඉදිකිරීම් කටයුතු 2014 දැයට කිරුළ ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර නිමකර ජනතා අයිතියට පත් කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4464/'13

6\.
ගරු අනුර දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2013 වර්ෂය තුළ දී පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පත් සකස් කිරීම සඳහා යොදා ගනු ලබන ආරක්ෂිත කාඩ්පත් 11ක් සහ මල්ටිමීඩියා යන්ත්‍ර 02ක් අතුරුදහන් වී තිබේද;

(ii) එසේ නම්, එම අතුරුදහන්වීම් පිළිබඳව දෙපාර්තමේන්තු මට්ටමින් පරීක්ෂණ පවත්වා ඊට වගකිවයුත්තන් හඳුනා ගනු ලැබ තිබේද;

(iii) සිදුවී ඇති අලාභය ඔවුන්ගෙන් අයකර ගනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් සිද්ධියට අදාළව කුරුඳුවත්ත පොලීසිය විසින් කරගෙන යනු ලබන පරීක්ෂණ මගින් අදාළ උපකරණ හා ද්‍රව්‍ය සොයාගනු ලැබ හෝ වරදකරුවන් හඳුනාගනු ලැබ තිබේද;

(ii) ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතු ආයතනයක සිදු වූ මෙම සිදුවීම පිළිබඳව රජයේ ස්ථාවරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4640/'13

7\.
ගරු පී. හැරිසන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෘෂි රසායන ද්‍රව්‍ය ආනයනය සඳහා ශ්‍රී ලංකාවේ ලියාපදිංචි වී ඇති සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සමාගම් අතරින් කෘෂි රසායන ද්‍රව්‍ය මහා පරිමාණයෙන් ආනයනය කරන ආයතන කවරේද;

(iii) මේ වන විට ශ්‍රී ලංකාවට ආනයනය කිරීම තහනම් කරනු ලැබ ඇති කෘෂි රසායන වර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සමාගම්වල නම්, ලිපිනයන් හා ලියාපදිංචි වූ දිනයන්;

(ii) තහනමට ලක්වන තෙක් එම කෘෂි රසායන ද්‍රව්‍ය මෙරටට ගෙන්වනු ලැබූ සමාගම්වල නම්;

(iii) තහනම් කරන ලද කෘෂි රසායන ද්‍රව්‍ය ලංකාවට ගෙන්වීම නිසා අසාධු ලේඛනගත (Black list) කර ඇති ආයතනවල නම්;

එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) අසාධු ලේඛනගත කිරීමට ලක්වූ ආයතනවල අධ්‍යක්ෂවරුන් වෙනත් නම්වලින් ආයතන ලියාපදිංචි කර ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ අය සම්බන්ධයෙන් ගනු ලබන නීතිමය පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4761/'14

8.
ගරු අශෝක් අබේසිංහ මහතා,— පශු සම්පත් හා ග්‍රාමීය ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සුළු හා මධ්‍ය පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා 2012 වර්ෂයේ වෙන් කළ මුදල කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි කර ඇති කුකුළු ගොවිපළ සංඛ්‍යාව කොපමණද;

(iv) ස්වයං රැකියාවක් ලෙස සුළු පරිමාණ කුකුළු ගොවිපළ සංවර්ධනය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4796/'14

9.
ගරු අජිත් පී. පෙරේරා මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) 2013 වර්ෂයේදී විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යාංශය මඟින් ඉතාලියේ හෝටල් ක්ෂේත්‍රයේ රැකියා සඳහා ශ්‍රී ලාංකිකයින් යොමු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, යොමු කරන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඔවුන්ගේ නම් සහ ලිපිනයන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) එම පිරිස තෝරා ගත් පදනම කවරේද;

(ii) එම පිරිස තෝරා ගැනීම සඳහා පුවත්පත් දැන්වීම් පළකිරීම හෝ වෙනත් ප්‍රචාරණ විධි ක්‍රමයක් අනුගමනය කරනු ලැබුවේද;

(iii) එසේ නම්, ඒ කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

4798/'14

10\.

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (3)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු තාප බලාගාරයේ විදුලි උත්පාදනය ආරම්භ කළ දින සිට මේ දක්වා එය අක්‍රිය වූ වාර ගණන සහ එක් එක් අවස්ථාවේදී අක්‍රියව තිබූ කාල සීමාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) මේ දක්වා එය අක්‍රිය වූ අවස්ථාවන්හිදී එහි අලුත්වැඩියා කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද;

(iii) එම අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් වැය වූ මුදල බලාගාරය අක්‍රිය වූ එක් එක් අවස්ථාව අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම අක්‍රියවීම් අදාළ උපකරණවල වගකීම් කාලය තුළ සිදු වූයේ නම්, ඉහත පරිදි මුදල් වැය කිරීමට හේතු කවරේද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නොරොච්චෝලේ තාප විදුලි බලාගාරයේ සිදුවූ අක්‍රියවීම් හේතුවෙන් එම කාල සීමාවන් තුළ වෙනත් බලාගාර ඔස්සේ ජාතික විදුලිබල පද්ධතියට විදුලිය එක් කිරීම සඳහා වැය කළ අතිරේක මුදල කොපමණද;

(ii) ඉහත තාප විදුලි බලාගාරයේ බිඳ වැටීම් හේතුවෙන් වැය වූ අතිරේක මුදල එකතු කළ විට විදුලි ඒකකයක් නිෂ්පාදනය කිරීම සඳහා කොපමණ මුදලක් වැය වී තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4941/'14

11\.

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ආරම්භ කළ දින සිට වාර්ෂිකව, එක් එක් උසස් අධ්‍යාපන ආයතනය මට්ටමින් මහපොළ ශිෂ්‍යත්ව වැඩ සටහන මගින් මූල්‍යාධාර ලැබූ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 1981 සිට මේ දක්වා මහපොළ ශිෂ්‍යත්ව යටතේ මූල්‍යාධාර ලැබූ සිසුන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල සඳහා දායක මුදල් ලැබෙන මාර්ග කවරේද;

(ii) මහපොළ ශිෂ්‍යත්ව ලබා දීම සඳහා අඩු ආදායම් ලබන සිසුන් තෝරා ගැනීම සෑහීමකට පත් විය හැකි, නිසි ක්‍රමවේදයක් අනුව සිදු වන්නේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) උසස් අධ්‍යාපන කටයුතු අවසන් කළ මහපොළ ශිෂ්‍යත්වලාභීන් ඉන් ලබා ගන්නා ප්‍රයෝජන පිළිබඳව පසු විපරමක් සිදු කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5027/'14

12\.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— සමූපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වන විට දේශීය වෙළඳපොළෙහි අළෙවි කරනු ලබන ශක්තිජනක පාන (Energy Drinks) වර්ග සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාන අතර ඇති දේශීයව නිෂ්පාදනය කරනු ලබන පාන වර්ග සංඛ්‍යාව කොපමණද;

(iii) ශක්තිජනක පානයන්හි ගුණාත්මකභාවය හා සෞඛ්‍යාරක්ෂිතභාවය තීරණය කරනු ලබන නිර්ණායක කවරේද;

(iv) 2014 වර්ෂ තුළදී ශක්තිජනක පාන සම්බන්ධයෙන් පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය වෙත ලැබී ඇති පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) එම පැමිණිලි සම්බන්ධයෙන් ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5072/'14

13\.

ගරු තිස්ස අත්තනායක මහතා,— ජාතික උරුමයන් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ විශේෂ ව්‍යාපෘති මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස තනතුරක් තිබේද;

(ii) එම තනතුරට අයත් කාර්ය භාරය කවරේද;

(iii) පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව තුළ එම තනතුර ආරම්භ කළ වර්ෂය සහ දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වන විට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ විශේෂ ව්‍යාපෘති මෙහෙයුම් අධ්‍යක්ෂ ලෙස කටයුතු කරනු ලබන පුද්ගලයාගේ නම කවරේද;

(ii) එම තනතුර දැරීම සඳහා එම පුද්ගලයා සතු අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) එකී තනතුර සඳහා හමුදා නිලධාරියකු පත් කිරීමේ අරමුණ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5199/'14

14\.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බිම් සවිය වැඩ සටහනේ මූලික පරමාර්ථ කවරේද;

(ii) අධිකරණය මගින් ලබාදුන් තීන්දුවකට පටහැනි ලෙස බිම් සවිය වැඩ සටහන යටතේ ඉඩම් මැනීමක් සිදු කිරීමට හැකියාවක් තිබේද;

(iii) එසේ නම්, එම ඉඩම් මැනීම කවර නීති ප්‍රතිපාදනයක් යටතේ සිදු කර තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) හෝමාගම දිසා අධිකරණයේ, නඩු අංක 2061 බෙදුම් නඩුවේ අවසන් තීන්දුව අනුව කොටස් 3කට කැබලි කළ ඉඩමක් එම තීන්දුවට පටහැනිව බිම් සවිය නිලධාරීන් විසින් කොටස් 2කට කැබලි කර ඇති බව දන්නේද;

(ii) එම ඉඩම එසේ බෙදීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5259/’14

15.

ගරු (අල්හාජ්) ඒ. එච්. එම්. අස්වර් මහතා,— මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙල්තොට - පල්ලේගම ප්‍රධාන මාර්ගය දීර්ඝ කාලයක සිට දැඩි ලෙස අබලන්ව ඇති බැවින් එම මාර්ගය භාවිතා කරන ජනතාව බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙන බවත්;

(ii) වැසි කාලයේදී එම මාර්ගය භාවිතා කරන පාසල් සිසුන් බොහෝ දුෂ්කරතා වලට මුහුණ දෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දෙල්තොට හා පල්ලේගම ප්‍රදේශවල ජීවත්වන ජනතාවගේ සුබසිද්ධිය උදෙසා එම ප්‍රධාන මාර්ගය ඉතා කඩිනමින් ප්‍රතිසංස්කරණය කර දීමට පියවර ගන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1),— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 23 දරන ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2),— 2014 ඔක්තෝබර් මස 25 වැනි සෙනසුරාදා, 27 වැනි සඳුදා, 28 වැනි අඟහරුවාදා, 29 වැනි බදාදා, 30 වැනි බ්‍රහස්පතින්දා, 31 වැනි සිකුරාදා සහ නොවැම්බර් මස 01 වැනි සෙනසුරාදා “විසර්ජන පනත් කෙටුම්පත (2015)” සලකා බැලීම සඳහා වෙන් කළ දිනයන් විය යුතු ය.

3.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 1),— ස්ථාවර නියෝග අංක 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, “විසර්ජන පනත් කෙටුම්පත (2015)” සලකා බැලීම සඳහා 2014 ඔක්තෝබර් මස 25 වැනි දින සිට ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා ඇති වෙන් කළ දිනයන්හි රැස්වීම් පැවැත්වෙන කාල වේලා පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 6.30 දක්වා ද විය යුතු ය. අ. භා. 6.00ට ස්ථාවර නියෝග අංක 7(5) සහ (6) ඡේදයන් ක්‍රියාත්මක විය යුතු ය.

4.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 2),— ස්ථාවර නියෝග අංක 70(2) හි කුමක් සඳහන් ව තිබුණද, "විසර්ජන පනත් කෙටුම්පත (2015)" සලකා බැලීම සඳහා වෙන් කළ, 2014 නොවැම්බර් මස 01 වැනි සෙනසුරාදා රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ. භා. 9.30 සිට අ. භා. 12.30 දක්වා ද, අ. භා. 1.30 සිට අ. භා. 5.00 දක්වා ද විය යුතු ය. අ. භා. 5.00ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

5.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම් (අංක 3),— අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2014 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 වන තෙක් කල් තැබිය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

ඩීඑෆ්සීසී බැංකුව (ඉවත් කිරීමේ හා ආනුෂංගික විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*2.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— 2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන් තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,—

2015 වර්ෂයේ අයවැය ඇස්තමේන්තු පිළිබඳ කාරක සභා අවස්ථාවේ වැඩසටහන සඳහා වෙන්කොට ඇති කාලසීමාව දින 17 ක් වන හෙයින් ද,

අයවැය කාරක සභා අවස්ථාවේ වැඩ සටහන සඳහා දිනකට පැය 8ක් පමණ වෙන්කර ඇති අතර, එක් දිනකදී අමාත්‍යාංශ කිහිපයක වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීමට සිදුවී ඇති හෙයින්, ඒ අනුව එක් වැය ශීර්ෂයක් සඳහා වෙන් කරනු ලැබ ඇත්තේ ආසන්න වශයෙන් පැය 02ක පමණ කාල සීමාවක් වන හෙයින් ද, ඒ අනුව එක් එක් අමාත්‍යාංශය තුළ වැය ශීර්ෂයන් සාකච්ඡා කිරීම සඳහා වෙන්කර ඇති කාලය සීමාසහිත වන හෙයින්ද,

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයාගේ සහ විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයාගේ එකඟත්වය පරිදි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී තීරණය කරන ලද මතු සඳහන් ඇමුණුමේ පරිදි අමාත්‍යාංශ 22 සහ විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂයන් පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

2. (අ) එම කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් නම් කරනු ලැබිය යුතුය.

(ආ) ස්ථාවර නියෝග අංක 95 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, මෙම කාරක සභාව ආණ්ඩු පාර්ශ්වයෙන් හා විරුද්ධ පාර්ශ්වයෙන් තෝරාගනු ලබන සාමාජිකයන් විසි එක් (21) දෙනෙකුට නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත විය යුතුය.

3. එකී කාරක සභාවට,—

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට; සහ

(ආ) පුද්ගලයන්, ලිපි ලේඛන හා වාර්තා ගෙන්වා ගැනීමට ද, පාර්ලිමේන්තුව හෝ සිය කාරක සභාව ඉදිරියේ පෙනී සිටින ලෙස යම් තැනැත්තෙකුට නියම කිරීමට ද;

බලය තිබිය යුතුය.

4. එකී තෝරාගත් අමාත්‍යාංශවල වැය ශීර්ෂයන්හි කාරක සභා අවස්ථාව ආරම්භ කරන දින හෝ එදිනට පෙර කාරක සභාව සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතුය.

ඇමුණුම:

1. විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය
   - (i) යහපාලනය හා යටිතල පහසුකම් අමාත්‍යතුමා
   - (ii) මානව සම්පත් අමාත්‍යතුමා
   - (iii) ග්‍රාමීය කටයුතු අමාත්‍යතුමා
   - (iv) ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමා
   - (v) නාගරික කටයුතු අමාත්‍යතුමා
   - (vi) සමාජ සුබසාධන අමාත්‍යතුමා
   - (vii) පාරිභෝගික සුබසාධන අමාත්‍යතුමා
   - (viii) ජාතික සම්පත් අමාත්‍යතුමා
   - (ix) විද්‍යාත්මක කටයුතු අමාත්‍යතුමා
   - (x) ජාත්‍යන්තර මූල්‍ය සහයෝගිතා අමාත්‍යතුමා
2. බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය
3. තැපැල් සේවා අමාත්‍යාංශය
4. ජාතික භාෂා හා සමාජ ඒකාබද්ධතා අමාත්‍යාංශය
5. නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය
6. සමාජ සේවා අමාත්‍යාංශය
7. ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
8. රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය
9. පුද්ගලික ප්‍රවාහන සේවා අමාත්‍යාංශය
10. මහජන සම්බන්ධතා හා මහජන කටයුතු අමාත්‍යාංශය
11. රාජ්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
12. ඵලදායිතා ප්‍රවර්ධන අමාත්‍යාංශය
13. ජාතික උරුමයන් අමාත්‍යාංශය
14. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
15. තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය
16. සුළු අපනයන භෝග ප්‍රවර්ධන අමාත්‍යාංශය

17. පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය
18. විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය
19. සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය
20. වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
21. සීනි කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
22. උද්භිද උද්‍යාන හා පොදු විනෝදාත්මක කටයුතු අමාත්‍යාංශය
23. විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය

*3.

ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*4.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මාර්තු 14 දිනැති අංක 1853/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 මැයි 21 දිනැති අංක 1863/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 3),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූලි 09 දිනැති අංක 1870/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 4),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූලි 15 දිනැති අංක 1871/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 5),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූලි 17 දිනැති අංක 1871/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමය (අංක 6),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 (2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2014 ජූලි 25 දිනැති අංක 1872/35 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.10.09 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*11.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2014 අගෝස්තු මස 07) [1]

*12.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*13.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*14.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද

ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යොන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*18.

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ නියෝග,— කලින් කල සංශෝධිත 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 46 වැනි වගන්තිය යටතේ කම්කරු සහ කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 මැයි 13 දිනැති අංක 1810/20 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.06.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*21.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1999 අංක 38 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ 2013.09.04 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් විජය කුමාරතුංග අනුස්මරණ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2013.09.13 දින සලකා බලන ලදී.)

*22.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1983 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපනය කරන ලද ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ 2013.11.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.07 දින සලකා බලන ලදී.)

*23.

සෞඛ්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2014.01.21 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.04.24 දින සලකා බලන ලදී.)

*24.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව - 2011,— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30 (2) වගන්තිය යටතේ 2013.10.10 දින ඉදිරිපත් කරන ලද 2011 ජනවාරි 01 දින සිට 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණය ඇතුළත් ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*25.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා පදනමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*26.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*27.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1984 අංක 6 දරන ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනතේ 37(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*28.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව - 2011,— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික පර්යේෂණ සභාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*29.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1981 අංක 55 දරන ශ්‍රී ලංකා මූලික අධ්‍යයන ආයතන පනතේ 36(4) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.22 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මූලික අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*30.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව - 2011,— 2005 අංක 32 දරන අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩල පනතේ 29(5) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*31.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව - 2011,— 1969 අංක 19 දරන පරමාණුක ශක්ති අධිකාරිය පනතේ 34(2) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පරමාණුක ශක්ති අධිකාරියේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*32.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (3) වගන්තිය යටතේ 2013.10.23 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කාර්මික තාක්ෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*33.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව - 2011,— 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ 27 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

*34.

තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා,— නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව - 2011,— 1994 අංක 11 දරන විද්‍යාව හා තාක්ෂණය වැඩි දියුණු කිරීමේ පනතේ 40(3) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2013.10.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාක් ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(තාක්ෂණ හා පර්යේෂණ කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාව විසින් 2014.02.21 දින සලකා බලන ලදී.)

35.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

36.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

37.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

38.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

39.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

[1]
"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.